

# තිස් වසරක මෙල්බර්න් මියැසි මෙහෙවර දස මස ඔබ මා

මෙල්බන් නුවර පැවැත්වෙන සංගීත ප්‍රසංග ප්‍රමාණය වසරින් වසරට ඉහළ යයි. වර්තමානයේ පැවැත්වෙන ප්‍රසංග බහුතරයක්ම පෞද්ගලික මට්ටමේ ප්‍රසංග යි.මීට වසර දහයකට පමණ කලින් මෙහි ප්‍රසංග සංවිධානයය කරනු ලැබුවේ පොදු කටයුතු සඳහා අරමුදල් රැස්කර ගැනීමේ අරමුණෙනි.එලෙස සංවිධානය වූ ප්‍රසංග වෙනුවෙන් සංගීතය සැපයූ කණ්ඩායම් අතර ''තරංගා'' වාද්‍ය වෘන්දය කැපී පෙනිණි. විශේෂයෙන්ම මවුබිමෙන් පැමිණ ප්‍රසංග ඉදිරිපත් කරන ප්‍රවීණ ශිල්පීන් වෙනුවෙන් සාධාරණය ඉටු කිරීමෙහිලා ''තරංගා'' ඉදිරියෙන්ම විය.

''තරංගා'' වාද්‍යවෘන්දය පිළිබඳව සිහි පත් කරනා විට නිතැතින්ම කියැවෙන නමකි,කැමරන් කොලඹගේ නාමය. කැමරන් ප්‍රමුඛ තරංගා කණ්ඩායමට ඇතුළත් වූයේ සම වයසේ වැඩිහිටි පිරිසක්ම පමණක්



නොවේ. අපගේ දෙවන පරම්පරාවේ දරු දැරියන් ද කැමරන් වටා රොක් වූහ කැමරන්ගෙන් වාදනය හුරු වීමට පැමිණි දරුවන් මෙන්ම වාද්‍ය භාණ්ඩ වයන්නෝද ගයන්නෝ ද ඒ අතර වූහ. එහි උච්චස්ථානයක් ලෙසින් වසර 2004 දී පැවැත්වුන වික්ටර් රත්නායකයන්ගේ ''ස'' ප්‍රසංගය සිහිපත් කළ හැකියි. එහි ගී දෙකක් සඳහා අපගේ දරු දැරියන් පහළොස් ලොස් දෙනෙකුගෙන් යුත් වාද්‍ය වෘන්දයක් වීණාව ඇතුළු භාණ්ඩ ගණනාවක් වාදනය කළේ කැමරන්ගේ පුහුණු කරවීම සහ උපදේශකත්වයෙනි.ඒ වාදන ආචාර්ය රත්නායකයන්ගේ දෑසට කඳුළු නංවා සංවේදී කරවන්නට තරම් සමත් විය. නිමල් අල්විස් ''චැනල් 31'' වෙනුවෙන් "ශ්‍රී ලංකා මෝනින් ශෝ " ඉරිදා වැඩ වැඩසටහන් වෙනුවෙන් අපගේ දරු දැරියනගෙන් සැදී ගායන හා වාදන වෘන්දය කළ ඉදිරිපත් කිරීම් වල ද නියමුවා වූයේ කැමරන් ය.මෙනයින් බලන කල අද පවත්නා සංගීත ප්‍රසංග ප්‍රවණතාවයට පසුබිම සැකසූ පිරිස් අතරින් කැමරන් කොළඹගේ ශිල්පියා දැවැන්ත වනස්පතිය

වෙමින් ආ සුභාවිත ගී රසාස්වාදය මෙන්ම ගායන හා වාදන ශිල්ප හරඹය පසුපසින් සිටින දැවැන්ත සෙවනැල්ලකි කැමරන්.

එවකට නිවෙස්වල රැස්වූ විට ගයන ගැයුම් මෙන්ම තැනින් තැන පැවත්වුන සාජ්ජ අතරින් කැපී පෙනුණු අපගේ ගායන හිතකාමීන් ස්වත්‍රන්ත ගී නිර්මාණ ගැයීමටත් ඒවා සංගීත තැටි වලට ගොනුකර එළිදැක්වීමටත් උනන්දු වීම තවත් එක් මෙල්බර්න් ප්‍රවණතාවයක් විය.එනිසාම මෙල්බර්න් ගීත සාහිත්‍යයක් මෙල්බර්න් මියැසි රටාවක් සහ මෙල්බර්න් ගායක ගායිකාවන් බිහි වූවා යැයි කීම අතිශයෝක්තියක් නොවේ. මෙහි දෙවන කාරනයේදී කැමරන් කොළඹගේ ඉහළින්ම කැපී පෙනෙන්නේ සිය ළයාන්විත මධුර තනු සහ සංගීත රටා නිසාවෙනි.මේ වන විට ඔහු ගීත 50 කට අධික ප්‍රමාණයකට තනු සහ සංගීතය නිර්මාණය කර ඇත්තේය.කැමරන්ගේ වැඩි රුචිකත්වය තමන් කලින් තනුව නිර්මාණය

කර ඊට පද ලියවා ගැනීම්ටයි. එනයින් තනු නිර්මාණ ගොනුවක් නිරතුරුව ඔහු වෙත වෙයි. තමන්ගේ සිත්ට එන තනුව පටිගත කර ගැනීමෙන් මෙය ගොනුව තර වෙයි.



කැමරන් කොළඹගේ ගිටාර් සහ විදුලි සර පුවරු වාදන ශිල්පියාගේ තනු හා සංගීත නිර්මාණ වෙනුවෙන් හඬ දයාද කළ මව් බිමේ ප්‍රවීනයන් අතරට මුලින්ම එක්වන්නේ කීර්ති පැස්කුවෙල් ගායන ශිල්පියායි. ඔහු ගැයූ ගී අතරින්. ''දස මස ඔබමා'' මව්ගුණ ගීත රසිකයාගේ සවනට හුරු ගීයකි. එහි රචනය කැමරන්ගේ වැඩිමල් සොයුරිය වන සිල්වියානා කොළඹගේ මහත්මියගේය. කීර්ති පැස්කුවෙල් ශිල්පියා සමිතා එරන්දතී ගායන ශිල්පිනිය සමග ගැයූ ''නිසල හද කල්පනා'' ගිය ද සමකාලීන ගියකි. එහි පද රචනය සමන් චන්ද්‍රනාත් වීරසිංහ රචකයාගේය.පසුකාලීනව ආචාර්ය වික්ටර් රත්නායකයන් ගැයූ ''මධු මල් පිපෙන ා'', ආචාර්ය රෝහණ වීරසිංහයන් ගේ සංගීතය සංයෝජනයෙන් අලංකෘත වූ කැමරන්ගේ තනුවකි. එමේන්ම අමරසිරි පීරිස් විශාරද වරයා ගැයූ කාල් තරංගා



කැමරන්ගේ තනුවට සහ සංගීතයට මහින්ද බන්ඩාර ශිල්පියාගේ මියැසි සැලසුම් අනුව සම්පූර්ණ වූ ගීයකි.මරියසෙල් ගුණතිලක ශිල්පිනියක් ගැයූ මුතු පබළු සිනා කැමරන්ගේ තනුව හා සංගීතය අනුව ගැනෙන මේ පද ර රචනා සිසිර දසනායකගේයි.

මෙල්බන් වාසී ගායන හිතකාමීන් වෙනුවෙන් කැමරන් කොළඹගේ ශිල්පියා දායාද කළ තනු ප්‍රමාණය 45ක් පමණ වේ මෙම ස්වතන්ත නිර්මාණ වෙනුවෙන් කැමරන් කිසිදු මුදලක් අය නොකිරීම නිසා ම ඔහු ප්‍රජාසත්කාරකයෙක් බවට පත්ව ඇත්තේය.



මෙල්බන් නුවර පුරා පසුගිය වසර 30 ක සත්කාරක ප්‍රසංග වෙනුවෙන් කැමරන් සිය ගිටාරය තත් හඬවා ඇත්තේ නොමිලයේය.මෙනයින් බලන කල ඔහුගේ මියැසි පුරාවත විමසීම් වැදගත් වේ. අවිස්සාවේල්ලේ විසූ අර්ල්ඩ් කොළඹගේ



ප්‍රවීන වාද්‍ය ශිල්පියාගේ පුතෙකු වන කැමරන්, පැට්‍රික් දෙණිනිපිටිය ප්‍රවීණ සංගීත ශිල්පියාණන්ගේ කණ්ඩායමට සම්බන්ධ වන්නේ සිය පියාගේ ආභාෂය ලබමිනි.පියා ඒ වන විටත් දිලීප දෙනිපිටිය ශිල්පියා සමග ක්‍රියාකාරීව මියැසියට ට මුසු වෙමින් සිටියේය ඒලෙසින්ම මීගමුවේ ලා ලංකන්ස් කණ්ඩායමටත් ශෙරින්ඩන් ඇන්ඩි ද සන්ශයින් කණ්ඩායමටත් කැමරන් පසුව පයනියර්ස් කණ්ඩායමටත් එක්වන්නේ වෘත්තීය මට්ටමින්. වසර 1976 ඇරඹූ මේ මියැසි චාරිකාවට ගායනය සහ වාදනය අංශ දෙකම ඇතුළලත් විය. වසර 1983 දී සිට සිය පියාණන්ට එක් වන කැමරන්ට මුලින්ම රූපවාහිනී වීී වැඩසටහනකට පෙනී සිටියේ එහි පස්වන සංවත්සරය වෙනුවෙනි. කැමරන් කොළඹගේ ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූයේ වස් වසර 1987 දීය. න්ම සිසිර සහ ඉන්ද්‍රානි සේනාරත්න යුවළගේ ප්‍රසංගයකට වාදනයෙන් එක්වූ ඔහු එදා මෙදාතුර අපගේ ගී ප්‍රසංග වේදිකාවේ නොසැලෙන ඉන්ද්‍රඛීලයක් සේ පෙනී සිටි.''රිප්ලේ'' සහ ''රිඩෙක්ශන් '' කණ්ඩායම් වෙනුවෙන් ගායනයෙන් සහ වාදනය වෘත්තීය මට්ටමෙන් දායක වන ඔහු ඉන්ද්‍රජිත් මිරිහාන ශිල්පියාගේ වාද්‍යවෘන්දයේද සාමාජිකයෙකි. මෙල්බර්න් මියැසි දිවිය සනිටුහන් කරමින් කැමරන් කොළඹගේ සංකීර්ණ සංගීත ශිල්පියාණන්ගේ ''දස මස ඔබ මා'' නමින් සංගීත ප්‍රසංගයක් වේදිකාගත කිරීමට ඔහුගේ සහෘදයෝ සූදානම් වෙති. හසී.ඒ නමින්ම සංගීත තැටියක්ද එළිදැක්වීමට නියමිතය. ඔහුගේ මෙහෙයවීම යටතේ ඔහුගේ ස්වතන්ත්‍ර ගී රැසක්ම මෙහි වෙසෙන ගායක



ගායිකාවෝ ගායනා කරති.

2019 අප්‍රේල් 28 වන ඉරිදා සවස 6 ට හැම්ඩන් පාර්ක් "රිවර්ගම් පර්ෆෝමින් ආර්ට් සෙන්ටර්හි දී පැවැත්වීමට නියමිත මේ ප්‍රසංගයට සංගීතය සැපයෙන්නේ ඉන්ද්‍රජිත් මිරිහාන, ජූඩ් ප්‍රනාන්දු, රෝහිත උඩුවෙල, සුසන්ත කුමාරගෙ, සමිත ජයතිලක, උපුල් දිගම්පිටිය, දර්ශන නාකන්දල, ගිහාන් මධුශාන්ත, රංග වික්‍රමාරච්චි සහ ක්‍රිස්ටි අමරනාත් යන පිරිස වෙතිනි. කථනය ''මෙල්බර්න් සහන්'' ගෙනි.ශබ්ද පරිපාලනයය ඉන්ද්‍රජිත් මිරිහාන ගෙනි.

වසර 30ක මියැසි අභිමානය සමරන කැමරන් කොළඹගේ ශිල්පියාණන් සමගින් ගී රස විඳිමින් සතුට බෙදා හදා ගැනීම්ටත්, ඔහුගේ මෙල්බර්න් මියැසි දායකත්වය වෙනුවෙන් කෘතවේදී වීමටත් 2019 අප්‍රේල් 28 දා හවස හයට ''රිවර්ගම් පර්ෆෝමින් ආර්ට් සෙන්ටර්'' හිදී සියලුම දෙනා හමුවෙමු කැමරන් කොළඹගේ සිල් පියාණන්ට සුභ පතන්නෙමු.

